# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2314/03 – 2023 ජනවාරි මස 09 වැනි සඳුදා– 2023.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2020/149.

**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණයේ) ව්‍යවස්ථාපිත අණපනත්වල (131 වන පරිච්ඡේදය වන) කාර්මික ආරාවුල් පනත**

4(1) වගන්තිය යටතේ දුන් නියෝගය අවලංගු කිරීම

1957 අංක 14 සහ 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ විධිවිධාන) පනත සමග කියවෙන) පනත්වලින් සංශෝධිත (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තිය යටතේ 2021.08.14 වැනි දින අංක 2240/38 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.08.05 වැනි දින දරන නියෝගයෙන්,

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සී. ජී. එස්. ගුණසේකර මයා, ඩී2, මල්ලන්ද, නාවලපිටිය.

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර පවත්නා 2021.08.03 වැනි දින දරන කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ සඳහන් කරන ලද කරුණු පිළිබඳව වූ කාර්මික ආරාවුල් බේරුම් කිරීමෙන් සමථයට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ආර්. එම්. සජිත් මිහිර බංඩාර මහතා වෙත යොමු කරන ලදී.

1A – G 38515 -14 (2023/01)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

බේරුම්කරු ආර්. එම්. සජිත් මිහිර බංඩාර මහතා එම ධූරයෙන් ඉල්ලා අස්වන බව දන්වා ඇත. එබැවින් යථෝක්ත නියෝගය අවලංගු කළ යුතු යැයි දැන් පෙනී යන හෙයින් කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මා එම නියෝගය අවලංගු කරන අතර, එකී 2021.08.05 වැනි දින දරන නියෝගය මත ක්‍රියා නොකරන ලෙස ද මෙයින් නියෝග කරමි.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය.

---

මගේ අංකය: IR/COM/01/2020/149.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව–

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සී. ජී. එස්. ගුණසේකර මයා, ඩී2, මල්ලන්ද, නාවලපිටිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනූෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බණ්ඩාරවෙල, කොළතැන්න, හිල්ඔය පාර, රික්ටන්, රවීන්ද්‍ර ලාල් ගුණවර්ධන මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය

මගේ අංකය: IR/COM/01/2020/149.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

සී. ජී. එස්. ගුණසේකර මයා, ඩී2, මල්ලන්ද, නාවලපිටිය.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ලංකා විදුලිබල මණ්ඩලය, අංක 50, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ ගාඩිනර් මාවත, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ** වනුයේ,

''ලංකා විදුලිබල මණ්ඩලයේ සේවයේ නියුතු සී. ජී. එස්. ගුණසේකර මහතාට ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනාධිකාරියේ යම් කිරීමක් හෝ නොකර හැරීමක් මත විදුලි ඉංජිනේරු II පංතිය I ශ්‍රේණියට පත් කිරීමේදී අසාධාරණයක් සිදුව තිබේ ද ? යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේද ? යන්නත් පිළිබඳව වේ.''

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 26 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල්තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01 - 0051

---

මගේ අංකය: IR/COM/02/2020/207.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත**

4(1) වන වගන්තිය යටතේ නියෝගය

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස් ජනරාල්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. ජී. නිමල් අත්තනායක මයා, අංක 320/E , ජයන්ති මාවත, පාදුක්ක .

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින් ද,

කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය මනුෂ නානායක්කාර වන මම, 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, හෝකන්දර උතුර, අරංගල, රණමයුර මාවත, 453/F නීතිඥ, වී.ජයරත්න මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

**මනූෂ නානායක්කාර,**
කම්කරු හා විදේශ රැකියා අමාත්‍ය.

2022 දෙසැම්බර් මස 29 වැනි දින,
කොළඹ දී ය

---

මගේ අංකය: IR/COM/03/2020/207.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

ඩබ්. ජී. නිමල් අත්තනායක මයා, අංක 320/E , ජයන්ති මාවත, පාදුක්ක .

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය, නො. 200, කිරුළ පාර, කොළඹ 05.

ඉහත සඳහන් පාර්ශවයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ රියැදුරෙකු ලෙස 1993.07.11 දින සිට සේවය කරමින් සිටියදී ඇති වූ අනතුරක් සම්බන්ධව පැවති විනය පරීක්ෂණ අවසන් වීමට පෙර 2003.03.26 දින විදේශගත වීම හේතුවෙන් සේවය හැර ගියා සේ සලකා අභියාචනා කිරීමෙන් අනතුරුව 2007.03.12 දිනැති ලිපියෙන් කොන්ත්‍රාත් සේවකයෙකු ලෙස පත් කර ඇති ඩබ්. ජී. නිමල් අත්තනායක මහතාට,

1. නැවත පත්වීම ලද පසු විනය පරීක්ෂණයක් සිදු කිරීම.

2. විනය පරීක්ෂණය අවසානයේ දඬුවම් ලෙස 2014.12.01 දින සිට 2015.04.30 දක්වා සේවය අත්හිටුවීම හා එම කාලයට වැටුප් අහිමි කිරීම මඟින්

අසාධාරණයක් සිදුව තිබේද යන්නත්, එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් හිමිවිය යුතු සහන කවරේද යන්නත් 1993.05.11 දින සිට මේ දක්වා අඛණ්ඩ කාලයක් පවතින සේ සැලකිය හැකි ද යන්නත් පිළිබඳව වේ."

**බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 දෙසැම්බර් මස 16 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් ජනරාල් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

EOG 01-0052

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.